(b) වායුගෝලයට විවෘත කරන ලද කෝස්ටික් පොටෑෂ් නිදර්ශකයක්, භාගිකව කාබනේටය බවට පරිවර්තනය වී ඇත. මෙම නිදර්ශකයේ අඩංගු KOH : $K_2CO_3$ අනුපාතය ඔබ නිර්ණය කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(c) මේවා සමඟ ඇමෝනියා කිනම් තත්ත්ව යටතේ , කෙසේ ප්‍රතික්‍රියා කරයිද?

i. $O_2$ ii. AgBr iii. Hi

(d) $(NH_4)_2SO_4$ හි ජලීය ද්‍රාවණයක් සින්ක් ලෝහය සමඟ ප්‍රතික්‍රියා කරන්නේ මන්දැයි පහද දෙන්න. මෙම ප්‍රතික්‍රියාවේදී සෑදෙන ඵල මොනවාද?

9. (a) පෝට්ලන්ඩ් සිමෙන්ති වල තිබෙන ලෝහමය මූලද්‍රව්‍ය දෙකක් සඳහා ඔබ පරීක්ෂා කරන්නේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න. Ca, Al

(b) මේවා සමග ජලීය සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් කිනම් තත්ත්ව යටතේ කෙසේ ප්‍රතික්‍රියා කරයිද?

i. ක්ලෝරීන් ii. සින්ක් iii. නයිට්‍රජන් ඩයිඔක්සයිඩ්

(c) i. d-ගොනුවේ මූලද්‍රව්‍යවල ලාක්ෂණික ගුණ මොනවාද?

ii. ලෝහ පිළිබඳ සාමාන්‍යයෙන් පිළිගෙන ඇති සරල ආකෘතිය භාවිතා කරමින් 'ලෝහ බන්ධනය' යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

iii. මෙම ආකෘතිය පදනම් කර ගනිමින්, ලෝහවල වැදගත් ගුණ දෙකක් පහද දෙන්න.

(d) අදාල මූලද්‍රව්‍යවල ඉලෙක්ට්‍රෝන වින්‍යාසය පදනම් කර ගනිමින් පහත සඳහන් කරුණු පැහැදිලි කරන්න.

i. සල්ෆර් වලට ඔක්සිකාරකයක් මෙන්ම ඔක්සිහාරකයක් වශයෙන් ද ක්‍රියා කළ හැකිය.

ii. $PH_3$ සහ $BF_3$ එකට ප්‍රතික්‍රියා කර සංකීර්ණ සංයෝගයක් සාදයි.

10. (a) ඇළක් මැද සිරස් යකඩ කණුවක් සිටුවා තිබේ. එය එම ආකාරයට දීර්ඝ කාලයක් තිබී ඇත. යකඩ කණුව විඛාදනයට භාජනය වී ඇති ආකාරය පහත දක්වා ඇත.




i. යකඩ කණුවේ විඛාදනය ඉහත ආකාරයට සිදුවී ඇත්තේ මන්දැයි පැහැදිලි කරන්න.

ii. යකඩ කණුව සිටුවීමට ඔබට අවස්ථාව ලැබුණි නම්, විඛාදනය අඩු කිරීමට ඔබ විසින් ගන්නා පියවර මොනවාද?

(b) එප්පාවල ඉතා විශාල ඇපටයිට් නිධි තිබේ. මේ ඛණිජයෙහි ජල ද්‍රාව්‍යතාව ඉතාමත් අඩු බැවින් එය හොඳ පොස්පේට් පොහොර ප්‍රභවයක් ලෙස උපයෝගී කරගත නොහැකිය. ඇපටයිට් ඇතැම් රසායනික ප්‍රතික්‍රියාවලට භාජනය කිරීමෙන් වඩා ද්‍රාව්‍ය සුපර් පොස්පේට් සහ ට්‍රිපල් සුපර් පොස්පේට් පොහොර බවට පරිවර්තනය කළ හැකිය. මැග්නටයිට් සමග පවතින කොපර් පයිරයිටීස් විශාල නිධි සේරුවිල තිබේ. කොපර් පයිරයිටීස් වාතයෙහි සාර කිරීමෙන් මේ ආකාරයේ ක්‍රියාවක් සිදු වේ.

$$CuFeS_2 \xrightarrow{O_2} Cu_2S + SO_2 + Fe_2O_3$$

(c) උෂ්මකයක දී කියුප්‍රස් සල්ෆයිඩ් පහත දැක්වෙන අයුරු ලෝහමය කොපර් සාදයි.

$$Cu_2S \xrightarrow{O_2} Cu_2O + SO_2$$
$$Cu_2S + Cu_2O \rightarrow Cu + SO_2$$

i. ලෝහමය කොපර් නිෂ්පාදනය කිරීම සඳහා සේරුවිල සම්බ වී ඇති ලෝපස් උපයෝගී කර ගැනීමට යෝජනා කර ඇතැයි සිතන්න. එප්පාවල ඇපටයිට් සහ සේරුවිල කොපර් ලෝපස් වාසිදායක ආකාරයට උපයෝගී කරගත හැකි රසායනික කර්මාන්ත පිළිවෙලක් ඉදිරිපත් කරන්න.

ii. ඔබ ඉදිරිපත් කරන රසායනික කර්මාන්ත පිළිවෙලෙහිදී මුහුණ දීමට අපේක්ෂා කරන ප්‍රශ්න පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

## 1981 අගෝස්තු - රසායන විද්‍යාව

I කොටස

1. බෙන්සීන් ග්‍රෑම් 78 ක ඇති මුළු පරමාණු සංඛ්‍යාව
(1) 12 ක් වේ. (2) $6.023 \times 10^{23}$ ක් වේ.
(3) $78 \times 6.023 \times 10^{23}$ ක් වේ. (4) $12 \times 6.023 \times 10^{23}$ ක් වේ.
(5) $\frac{12 \times 6.023 \times 10^{23}}{12}$ ක් වේ. (සා. ප. ස. : C = 12, H = 1)

2. පරමාණුවක අරය පහත සඳහන් වන ගණයේ වේ.
(1) $10^{4}$ cm (2) $10^{-4}$ cm (3) $10^{-10}$ cm (4) $10^{-8}$ cm (5) $10^{-12}$ cm

3. X කිරණ සොයා ගනු ලැබුවේ කවරකු විසින්ද?
(1) තොම්සන් (2) බෙකරල් (3) රොන්ට්ජන්
(4) මාරි කියුරි (5) මෝස්ලි

4. හයිඩ්‍රොකාබනයක, බර අනුව කාබන් 85.7% ක් අඩංගුය. එහි ආනුභාවික සූත්‍රය කුමක්ද?
(සාපේක්ෂ පරමාණුක ස්කන්ධ : C = 12, H = 1)
(1) $CH_4$ (2) CH (3) $CH_2$ (4) $C_2H_3$
(5) මින් එකක්වත් නොවේ.

5. $BeCl_2$ අණුවක හැඩය
(1) තලීය වේ. (2) කෝණාකාර වේ. (3) ත්‍රිකෝණාකාර වේ.
(4) රේඛීය වේ. (5) මින් එකක්වත් නොවේ.

6. $CH_2=CHCH_2CO_2H$ හි IUPAC නාමය,
(1) බියුටීන් -3-ඔයික් අම්ලය වේ.
(2) බියුට්-1-ඊනොයික් අම්ලය වේ.
(3) ප්‍රොප්-1-ඊන්-3 කාබොක්සිලික් අම්ලය වේ.
(4) ප්‍රොප්-2-ඊන්-1 කාබොක්සිලික් අම්ලය වේ.
(5) බියුට්-3-ඊනොයික් අම්ලය වේ.

7. පහත සඳහන් ඒවායින් සම ඉලෙක්ට්‍රෝනික නොවන්නේ කවරක්?
(1) CO (2) $O_2$ (3) $N_2$ (4) $CN^-$ (5) $NO^+$

8. M නම් මූලද්‍රව්‍යය ස්ථායි $M^{2+}$ අයනයක් සාදයි. M නම් මූලද්‍රව්‍යයට සහ $M^{2+}$ අයනයට එක සමාන

(1) නාෂ්ටි ආරෝපණ ඇත. (2) රසායනික ගුණ ඇත.
(3) ඉලෙක්ට්‍රෝන බන්ධුතාවක් ඇත. (4) පරිමාවක් ඇත.
(5) ද්‍රාව්‍යතාවක් ඇත.

9. ෆෝමැල්ඩිහයිඩ්, වියලි ඊතර් මාධ්‍යයක ඇති RMgX සමග ප්‍රතික්‍රියා කරවීමෙන් ලැබෙන ඵලය ජලවිච්ඡේදනය කරන ලදී ජල විච්ඡේදනයෙන් පසුව ලැබෙන ඵලය මෙය වේ.
(1) RCHOHR (2) RH (3) $R-C(R)(R')-OH$
(4) $RCH_2OH$ (5) RCOR

10. AgCl හි ද්‍රාව්‍යතා ගුණිතය ($K_{sp}$) $1 \times 10^{-10}$ $mol^2 l^{-2}$ වේ. AgCl වලින් සන්තෘප්ත කරන ලද 0.01 M NaCl ද්‍රාවණයක ඇති $Ag^+$ සාන්ද්‍රණය ලීටරයට මවුල,
(1) $10^{-8}$ ක් වේ. (2) $10^{-12}$ ක් වේ. (3) $10^{-18}$ ක් වේ.
(4) $10^{-10}$ ක් වේ. (5) $10^{-4}$ ක් වේ.

11. $C_4H_{10}O$ යන අණුක සූත්‍රය ඇති ප්‍රකාශ සක්‍රිය නොවන සමාවයවික සංඛ්‍යාව
(1) 9 ක් වේ. (2) 4ක් වේ. (3) 8 ක් වේ.
(4) 6ක් වේ. (5) 7ක් වේ.

12. (a) $HClO_3$ (b) $HClO_4$ (c) $Cl_2O$ (d) HCl යන සංයෝගවල ඇති ක්ලෝරීන්වල ඔක්සිකරණ අංකය වැඩිවන ආකාරය දැක්වෙන නිවැරදි අනුපිළිවෙල කුමක්ද?
(1) c<d<b<a (2) b<a<c<d (3) a<b<d<c (4) d<c<a<b (5) a<d<c...

13. ලෝහවල විද්‍යුත් රසායනික හැසිරීම මුලින්ම සොයා ගනු ලැබුයේ කවරකු විසින්ද?
(1) පැරඩේ (2) ගැල්වානි (3) ජූල් (4) රදර්ෆඩ් (5) කෙල්වින්

14. බෙන්සීන් ඩයසෝනියම් ක්ලෝරයිඩ්, එතිල් මධ්‍යසාරය සමග ප්‍රතික්‍රියා කිරීමේ දී සෑදෙන ඵලය මෙය වේ.



(1) (2) (3) (4) (5)

15. මින් කුමන සංයෝගයෙහි සම්මත උත්පාදන එන්තැල්පිය එ... වරකින් යුත් රසායනික ප්‍රතික්‍රියාවකින් ලබාගත ...
(1) $CH_3CO_2H$ (2) $CH_3CHO$ (3) CO

16. ...

www.sinhalaelibrary.com

Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras